# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

(Recovery Plan for Learning Loss – 2022)

(8 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13 ක් ද දෙවන හා තෙවන වාර වල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නර්තනය

## 8 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| පළමු වාරය | | | | | |
|---|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් ඵල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි | 2.2<br>පාද නිවැරදිව හැසිරවීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි. | • පා සරඹ /මණ්ඩි පද තාල තබමින් කියයි.<br>• විධික්‍රම අනුගමනය කරමින් පා සරඹ/මණ්ඩි පද ඉදිරිපත් කරයි<br>• 7 - 9 තෙක් පා සරඹ/මණ්ඩි පද කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කරයි.<br>• නිවැරදි අංගහාර හා ඉරියව් අනුගමනය කරමින් පා සරඹ /මණ්ඩි පද ඉදිරිපත් කරයි<br>• විලම්භ හා මධ්‍ය ලය පිළිබඳ අවබෝධයෙන් යුතුව පා සරඹ/ මණ්ඩි පද ඉදිරිපත් කරයි. | • 7 - 9 තෙක් පා සරඹ/මණ්ඩි පද අභ්‍යාස කිරීම<br>• විලම්භ මධ්‍ය ලයට අභ්‍යාස කිරීම<br>• නිවැරදි අංගහාර සහිතව සරඹ පද හා හමාර පද අභ්‍යාස කිරීම | 2.2<br>නර්තනයට පාද හුරු කර ගනිමු. | 3 |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.3<br>නර්තන හා සබැඳි විධික්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි. | • සරඹ පද විලම්භ, මධ්‍ය ලයට තාල තබමින් කියයි.<br>• කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය තාල තබමින් කියයි.<br>• විධික්‍රම අනුගමනය කරමින් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරයි.<br>• විලම්භ , මධ්‍ය ලය ට අනුව සරඹ අභ්‍යාස කරයි.<br>• බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර සහිතව සරඹ ඉදිරිපත් කරයි. | • ගොඩ සරඹ /ඉලංගම් සරඹ/ දෙඔීන පද 5 - 6 තෙක් දක්වා තාල තබා කීම.<br>• ගොඩ සරඹ /ඉලංගම් සරඹ/ දෙඔීන පද 5 - 6 තෙක් දක්වා පද නර්තනය<br>• බෙර වාදනයට අනුව නර්තනය<br>• සමගුණ දෙගුණයට අනුව නිවැරදි අංගහාර සහිතව නර්තනය<br>• කස්තිරම /ඉරට්ටිය/ හමාර පද නර්තනය | 2.3<br>නර්තනයට හස්ත හා පාද හුරු කර ගනිමු. | 4 |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම | 2.4<br>සාම්ප්‍රදායික නර්තන ඇසුරෙන් | • මැදුම් තනි තිතට අලංකාර මාත්‍රා නිර්මාණය කරයි. | • මාත්‍රා 3 කාලයට අලංකාර පද නිර්මාණය | 2.4<br>බෙර හඬ මැද්දේ නටමු පද සිත් සේ | 3 |

| | | | | | |
|---|---|---|---|---|---|
| අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | අලංකාර මාත්‍රා නිර්මාණය කරයි. | • අදාළ තිතට අනුව අලංකාර මාත්‍රා ඉදිරිපත් කරයි.<br>• නිර්මාණය කරන ලද අලංකාර මාත්‍රා විවිධ නර්තනාංග සඳහා භාවිතයට ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• බෙර වාදනයට අනුව සාමූහිකව අලංකාර මාත්‍රා නර්තනය කරයි. | ➢ කණ්ඩායම් වශයෙන් අලංකාර පද නිර්මාණය කිරීම.<br>➢ අලංකාර මාත්‍රා සතතභ්‍යාසයේ යෙදීම.<br>• බෙර වාදනයට අනුව අලංකාර පද නර්තනය<br>• යොදාගත හැකි අවස්ථා පිළිබඳ අදහස් දැක්වීම. | | |
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනය කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2<br>නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි. | • ගායන වලට අදාළ තාල රූප නම් කරයි.<br>• නියමිත නාද මාලාවට අනුව නර්තනය කරයි.<br>• බෙර වාදනයට අනුව තාල තබමින් ගායනය ඉදිරිපත් කරයි.<br>• ඒකීය හඬ තලයක පිහිටා ගායනය ඉදිරිපත් කරයි.<br>• සාමූහිකව ගායනය ඉදිරිපත් කරයි. | • සිරස පාද කවි/පතුරු කවි/සවරම් කවි ගායනය<br>• වෛරොඩි/ඊශ්වර කුණ්ඩ තාලය/කදම්භ පක්ෂි වන්නම ගායනය<br>➢ නිවැරදි නාද මලාවට අනුව ගායනය<br>➢ කණ්ඩායම් වශයෙන් හා ඒකල ව ගායනය<br>➢ ඒකීය හඬ තලය හා ස්වකීය හඬ තලය හඳුනා ගෙන ගායනය කිරීම. | 4.2<br>ජන කවි ගායනය කරමු. | 1 |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5<br>නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • 7 ශ්‍රේණියේ ඉගෙන ගන්නා ලද වන්නම සමුපූර්ණයෙන් නර්තනය කරයි.<br>• තුරගා වන්නම, වෛරොඩි වන්නම/හවාදි තාලය, සින්දු වන්නම, ඊශ්වර කුණ්ඩ තාලය/කුධිරදි වන්නම, කදම්භ පක්ෂි වන්නම අදාළ කස්තිරම හා සීරුමාරුව, අඩව්ව/ඉරට්ටිය/කලාසම, අඩව්ව තාල තබමින් කියයි.<br>• වන්නමට අදාළ කස්තිරම, සීරුමාරුව/ අඩව්ව/ඉරට්ටිය/කලාසම, | • 7 ශ්‍රේණියේ උගන්වන ලද තුරගා වන්නම හවාදි තාල සින්දු වන්නම/ කුධිරදි වන්නම ගායනය කරමින් බෙර වාදනයට අනුව සම්පූර්ණයෙන් නර්තනය<br>• වෛරොඩි වන්නම/ඊශ්වර කුණ්ඩ තාලය/කද්ම්භ පක්ෂි වන්නම ගායනා කරමින් නර්තනය<br>• අදාළ කස්තිරම්/ඉරට්ටි/කලාසම බෙර වාදනයට අනුව නර්තනය | 2.5.1<br>වන්නම් ගයමින් නටමු. | 2 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අඩව්ව බෙර වාදනයට අනුව නර්තනය කරයි.<br>• වන්නම බෙර වාදනයට අනුව ගායනයට අනුව නර්තනය කරයි. | • කණ්ඩායම් වශයෙන් නර්තනය | | |
| **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | | | | | 13 |